පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- කතෝලික ධර්මය I, II

පාසලේ නම : ....................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03 වි. 10යි

## I. කොටස

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ගන්න.

1. ද්විතීය සම්මත ග්‍රන්ථ වලට අයත් තෝබිත් , ජුදිත් ,1 මකබිවරු , 2 මකබිවරු යන ග්‍රන්ථ පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය යටතේ අයත් වන්නේ කිනම් පොත් යටතට ද?
   - i. පංච පුස්තකය
   - ii. එලිදරව් සාහිත්‍ය ය
   - iii. ඉතිහාස පොත්
   - iv. දිව්‍යසි ග්‍රන්ථ
2. නව ගිවිසුමෙ හි සභා ඉතිහාසය පිළිබඳ ලියවුණු පොතක් ලෙස පිළිගනු ලබන්නේ ,
   - i. එළිදරව් සාහිත්‍ය ය
   - ii. ගලාති ලිපිය
   - iii. එපීස ලිපි
   - iv. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
3. නව ගිවිසුමේ පොත් අතරින් වැඩිම පොත් ප්‍රමාණයක් ලියා ඇති කතුවරයා වන්නේ,
   - i. ශුද්ධ වූ ලූක් තුමා
   - ii. ශුද්ධ වූ පාවුළු තුමා
   - iii. ශුද්ධ වූ මතෙව් තුමා
   - iv. ශුද්ධවූ පේදුරු තුමා
4. එළිදරව් සාහිත්‍යය තුළ ඉදිරිපත් කෙරෙන සත්ව සංකේත දෙකක් වන බැටළුවා හා මකරා තුළින් දැක්වෙනුයේ ,
   - i. දෙවියන් වහන්සේ හා ඊශ්‍රායෙල් ජනතාව ය.
   - ii. යක්ෂයා හා අයහපත් බලවේගයන් ය.
   - iii. ක්‍රිස්තුන් වහන්සේ හා යක්ෂයා ය.
   - iv. ආරම්භය හා අවසානය දැක්වීමේ සලකුණුය.
5. "හොක්මා " යන හේබ්‍රෙව් වචනයේ අර්ථය වනුයේ ,
   - i. සාර්ථකව හා ධර්මිෂ්ඨව ජීවත් වීමේ හැකියාවයි.
   - ii. අඳුරෙන් එළියට පැමිණිය යුතු බවයි.
   - iii. ජීවිතයේ ප්‍රීතිමත්ව ගත කරන අවස්ථාවයි.
   - iv. දෙවියන් වහන්සේ නිතරම අප සමග බවයි.
6. එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන අවස්ථා පිළිබඳ මඟ පෙන්වීමක් කරන ශුද්ධවූ බයිබලයේ ග්‍රන්ථය,
   - i. ධර්මදේශකයා
   - ii. ප්‍රඥා ව
   - iii. හිතෝපදේශය
   - iv. ප්‍රේම ගී
7. ජේසුස් වහන්සේ අපෝස්තුළුවරුන්ට පව් කමා කිරීමේ බලය දානය කලේ .................... සවසය.
   - i. ගොබ් ඉරිදා
   - ii. පාස්කු ඉරිදා
   - iii. මහ සිකුරාදා මහ
   - iv. බ්‍රහස්පතින්දා
8. පෙන්තකොස්ත දින ජෙරුසෙලම් චතුරශ්‍රයේ දී පේදුරුතුමා අන්‍ය භාෂා වලින් කතා කරනු ඇසූ සියලු දෙනා පුදුමයට පත්වූයේ ,
   - i. ඔහු ක්‍රිස්තු ශ්‍රාවකයෙකු වූ බැවින්.
   - ii. ඔහු නූගත් යැයි සම්මත ගලීල වැසියෙකු වූ බැවින්.
   - iii. ඔහු ධීවරයෙකු වූ බැවින්.
   - iv. ඔහු වෛරී මතින් සිටි බැවින්.
9. අපෝස්තුලුවරුන් දොළොස් දෙනා අතරින් පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වන්නේ,
   - i. ශු.ස්තේපන් මුනිතුමා ය.
   - ii. ශු. මහා ජාකොබ් හෙවත් සන්තියාගෝ මුනිතුමා ය.
   - iii. ශුද්ධවූ පේදුරු මුනිතුමා ය.
   - iv. ශුද්ධ වූ පාවුලු මුනිතුමා ය.
10. ක්‍රිස්තුන් වහන්සේ පාවුලු තුමාගේ ජීවිතය වෙනසකට ලක් කළේ ,
    - i. කොරින්තියේ දීය
    - ii. ජෙරුසෙලමේ දීය.
    - iii. දමස්කස් හිදීය
    - iv. අන්තියෝකියේ දී ය.

11. ඔබ ක්‍රිස්තුවරයාණෝ ය ......................................" මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර තෝරන්න.
   i. මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය
   ii. ලෝකයේ ආලෝකය ය.
   iii. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය.
   iv. වඩින්නට සිටින තැනැත් වහන්සේ ය.

12. ශුද්ධ වූ සභාවේ එකමුතුකමේ පදනම වන්නේ ,
   i. ශුද්ධවූ ත්‍රිත්වයයි.
   ii. ශුද්ධවූ පවුලයි.
   iii. ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයයි.
   iv. සකල ජනතාවයි.

13. ජීවත්වීම යනු ක්‍රිස්තුන් වහන්සේ සමඟ විසීමයි. ක්‍රිස්තුන් වහන්සේ වැඩ සිටින්නේ කොතැනද එහි ජීවනයද දේව රාජ්‍යය ද ඇත" මෙසේ පවසන්නේ,
   i. ශුද්ධ වූ පාවුළු තුමා .
   ii. ශුද්ධවූ අම්බ්‍රෝස් තුමා .
   iii. ශුද්ධවූ දෙවන ජුවාම් පාවුළු පාප්තුමා .
   iv. ශුද්ධ වූ ස්නාවක ජුවාම් තුමා .

14. භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා සිදුකළ ප්‍රාතිහාර්යයක් නොවන්නේ ,
   i. දැඩි නියඟයක දී මහනුවර රාජධානියට වැස්ස ලබා දීම.
   ii. දැදුරු ඔයෙන් පා ගමනින් එතෙර වීම.
   iii. තනි අලියෙකු මෙල්ල කිරීම.
   iv. මුහුද මත ඇවිදීම.

15. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත ලෝක අවසානය දක්වා අඛණ්ඩව සිදු කරනු ලබන්නේ ,
   i. පාද නමස්කාරය තුළිනි
   ii. ශුද්ධ වූ පැය තුළිනි
   iii. දිව්‍ය පූජාව තුළිනි.
   iv. දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව තුළිනි.

16. පුරාණ ගිවිසුමේ පළමු වරට පූප සහ මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළ තැනැත්තා වන්නේ,
   i. ජේසුස් වහන්සේ ය
   ii. සිමියොන් ය.
   iii. මෙල්කිසෙදෙක් ය.
   iv. ජෝෂුවා ය.

17. 'පාරාවෝ රජුගේ කුළුඳුල් පුත්‍රයා ගේ පටන් සෑම නිවසකම කුලුඳුලන් මරණයට පත්වුණා යන සිදුවීම සම්බන්ධ වන්නේ මිසරයට පැමිණි කීවෙනි වසංගතයේ දී ද?
   i. හත්වෙනි වසංගතයේ දී.
   ii. තුන්වෙනි වසංගතයේ දී.
   iii. දහවෙනි වසංගතයේ දී
   iv. හයවෙනි වසංගතයේ දී.

18. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංගයක් නොවන්නේ,
   i. පාස්කු බැටළුවා .
   ii. තිත්ත පලා .
   iii. මන්නා ආහාරය.
   iv. මිදි යුෂ.

19. ජේසුස් වහන්සේ ගෝලයින්ගේ පාද සේදීමේ සිද්ධිය ගෙනහැර දක්වන එකම සුවිශේෂ කතුවරයා වන්නේ ,
   i. ශු.ජොහාන් තුමාය.
   ii. ශු මතෙව් තුමාය.
   iii. ශු.මාක් තුමාය.
   iv. ශු.ලූක් තුමාය.

20. මැක්ෂිමිලියම් කෝල්බේ පියතුමා ආරම්භ කළ සංවිධානය වන්නේ ,
   i. ශුද්ධවූ විසෙන්ති ද පාවුලා සමිතිය.
   ii. දිව්‍ය හෘදයේ සමිතිය.
   iii. ධර්මදූත ළමා සමාජය.
   iv. මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව.

21. දස පනතේ තුන්වන පනතට විරුද්ධව සිදු කරන ක්‍රියාවක් වන්නේ,
   i. දෙවි කෙනෙක් නැතැයි කියා සිතා කටයුතු කිරීම.
   ii. අසභ්‍ය වීඩියෝ පට නැරඹීම.
   iii. අසල්වැසියාගේ දෙයට ඇලුම් කිරීම.
   iv. ඉරුදින දිව්‍ය පූජාව හා දහම් පාසල අතපසු කර අමතර පන්ති වලට සහභාගි වීම.

22. මාගේ පුත්‍රය පියාගේ අවවාදය අසන්න. මවගේ උපදෙස් ඉවත නොදමන්න" මෙසේ සඳහන් වන්නේ ,
   i. කොරින්ති ලිපියේ ය.
   ii. එපීස ලිපියේ ය.
   iii. හිතෝපදේශයේ ය.
   iv. උපදේශකයා හෙවත් සිරාක් පොතේ ය.

23. හිමාලි තම ඉගෙනීමේ කටයුතු මග හරිමින් දෙමාපියන්ගේ බලාපොරොත්තු කඩ කළා ය" ඇය කඩ කළ දේව පනත වන්නේ ,
   i. හතරවන දේව පනත ය.
   ii. පස්වන දේව පනතය.
   iii. හයවන දේව පනතය.
   iv. හත්වන දේව පනතය.

24. පෞද්ගලික දේපළ පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව සඳහන් වන දේව පනත් දෙක වන්නේ ,
   i. 7 සහ 10 පනත් ය.
   ii. 4.සහ 6 පනත් ය.
   iii. 8 සහ 9 පනත් ය.
   iv. 5 සහ 6 පනත් ය.

25. බොරු කීමේ විපාක පිළිබඳව පෙන්වා දෙන ශුද්ධවූ බයිබලයේ සිද්ධියක් වන්නේ ,
   i. සකේවුස් පිළිබඳ සිදුවීම.
   ii. අනනියස් සහ සපීරා ගේ සිදුවීම.
   iii. වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමා කතාව.
   iv. ධනපතියා හා ලාසරස් පිළිබඳ කතාව.

26. ජනවන්දනා වර්ෂය අවසන් වන සාමාන්‍ය සමයේ 34 වන ඉරුදිනට යෙදෙන මංගල්‍යය වන්නේ ,
   i. දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයයි.
   ii. ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍යය යි.
   iii. ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය යි.
   iv. දිව්‍ය හෘදයේ මංගල්‍යයයි.

27. ස්වාමිවාක් ආරාධනාව දිව්‍ය පූජා යාගයේ වර්තමාන ස්ථානයට ගෙන එන ලද සුදතුමි පියා වන්නේ ,
   i. හයවන පාවුළු ශුද්ධෝත්තම පියතුමා .
   ii. පළමුවන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා .
   iii. දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා .
   iv. ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා .

28. උත්තම පූජක යැදුමේ ප්‍රධාන තේමාව වන්නේ ....................යි. මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර තෝරන්න.
   i. බලාපොරොත්තුව.
   ii. සමාදානය
   iii. එකමුතුකම.
   iv. කැපවීම.

29. ජේසුස් වහන්සේගේ ධර්මදූත කාර්යයේ උච්චතම අවස්ථාව වනුයේ ,
   i. පන්දහසකට කෑම දීම.
   ii. පඬිවරුන් මැද දේශනා කිරීම.
   iii. ශ්‍රාවකයින් තෝරා ගැනීම.
   iv. දුක් විඳීම මරණය සහ උත්ථානය.

30. ස්වර්ග රාජ්‍යය උරුම වනුයේ ,
   i. ශෝක වන්නන්ට ය.
   ii. දිනපතා යාච්ඤා කරන අයටය
   iii. යුක්තිය උදෙසා පීඩා විඳින අයට ය.
   iv. තැන්පත් ජීවිත ගත කරන අයටය.

31. ජේසුස් වහන්සේ නව මෙසියස් හා නව මෙසියානික ගුරුවරයා බව පෙන්වීම සිය සුවිශේෂයේ පරමාර්ථය කර ගත්තේ ,
   i. මතෙව් තුමා
   ii. මාක් තුමා ය
   iii. ලූක් තුමා ය.
   iv. ජොහාන් තුමා ය.

32. ප්‍රාග් ඉතිහාසය තුළ ඇති කතාන්දරවලින් උගත හැක්කේ .................. පණිවිඩ මිස විද්‍යාත්මක හෝ ඓතිහාසික සත්‍යතා නොවේ . හිස්තැනට සුදුසු වචනය වන්නේ ,
   i. දාර්ශනික
   ii. දේව ධාර්මික.
   iii. පෞරාණික.
   iv. නිර්මාණාත්මක.

33. නව මැවිල්ලේ ආරම්භකයා ලෙස තෝරා ගත්තේ ,
   i. ජෝෂුවා ය.
   ii. නෝවා ය.
   iii. මෝසෙස් ය.
   iv. ආබෙල් ය.

34. 'මිසර දේශයේ මාගේ හාස්කම් වැඩි වන පිණිස පාරාවෝ ඔබට සවන් නොදෙනු ඇත ."යනුවෙන් දෙවියන් වහන්සේ පවසන ලද්දේ,
   i. ආබ්‍රහම්ටය.
   ii. මෝසෙස්ට ය.
   iii. ජෝශප්ට ය.
   iv. දාවිත්ට ය

35. "ධර්මදූත සේවාව සඳහා යාමේදී පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ රැගෙන නොයන්න" යන කීමෙන් අරුත් ගැන්වෙන්නේ ,
   i. දේව ආදරයයි.
   ii. දේව කරුණාවයි.
   iii. දිව්‍ය සංරක්ෂණයයි.
   iv. දිව්‍ය මගපෙන්වීමයි.

36. ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන හා අනිවාර්ය සංකේතය වන්නේ ,

i. ආලේප කිරීම.
ii. සුදු වස්ත්‍රය
iii. පාස්කු ඉටි පහන
iv. ජලය

37. අප අතින් යම් කිසි පාපයක් සිදු වූ බව දැනගත් විට මුලින්ම කළ යුතු වන්නේ ,

i. ශෝක වීමයි.
ii. මනස්ථාපනය වීමයි.
iii. පාපය පිළිකුල් කිරීම යි.
iv. ඒ පිළිබඳව සිතමින් කල් ගත කිරීමයි.

38. මුල් යුගයේ තාපසයන් සාමූහිකව ජීවත් වූ බවට සාක්ෂි ලැබී ඇත්තේ ,

i. පළමු වන සියවසේ පමණ.
ii. දෙවන සියවසේ පමණ.
iii. තුන්වන සියවසේ පමණ.
iv. හතරවන සියවසේ පමණ.

39. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ අධ්‍යාත්මික පියවර තුන වන්නේ ,

i. බැලීම, විග්‍රහය හා ක්‍රියාවයි.
ii. බැලීම, විග්‍රහය හා යැවීමයි.
iii. යැවීම, විග්‍රහය හා ක්‍රියාවයි
iv. කැඳවීම, යැවීම හා බැලීමයි.

40. යාමයෙන් යාමයට දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන්නේ ,

i. ශුද්ධවූ සභාව එසේ කරන්නට නියම කර ඇති නිසා ය.
ii. කාලය දෙවියන් වහන්සේට අයිති නිසා ය.
iii. එසේ කිරීමෙන් අපේ ඉල්ලීම් අනිවාර්යයෙන් ඉටු වන නිසා ය.
iv. එය කිතුණුවාගේ වගකීමක් වන නිසා ය.

***

## II. කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න .
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමිවේ .

(01) i. මැවීමේ කතා දෙක අයත් සම්ප්‍රදායන් **දෙක** ලියන්න.
ii. ශුද්ධවූ මතෙව් ශුභාරංචිය සඳහා භාවිතා වන වෙනත් නම් **දෙකක්** ලියන්න.
iii. දේව මැවිල්ල පාලනය කිරීම සඳහා යෙදෙන හේබ්‍රෙව් **වචනය** සහ එහි **අර්ථය** ලියන්න.
iv. උත්පත්ති පොතේ සඳහන් පරිදි ස්ත්‍රියගේ රුචිය ප්‍රකාශ කළ ආකාර **දෙකක්** ලියන්න.
v. ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා කරන සංකේතාත්මක ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.
vi. ජන වන්දනාවේ ප්‍රධාන අංග **දෙකක්** නම් කරන්න.
vii. දේව දූතයා සකරියස් තුමා ට ස්නාවක ජුවාම් තුමාගේ උපත පිළිබඳ දැනුම් දෙන අවස්ථාවේදී එතුමා පිළිබඳ ප්‍රකාශ කරන ලද ප්‍රධාන කරුණු **දෙකක්** ලියන්න.
viii. ශුද්ධවූ සභාව , ජනවන්දනා වසරේ මනස්ථාපන කාල ලෙස නම් කර ඇත්තේ කුමන කාල පරිච්ඡේද **දෙකද**?
ix. ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයේ දී මිනිසා විනිශ්චයට ලක් වන ප්‍රධාන මිනුම් දඬු **දෙක** මොනවා ද?
x. සදාචාරාත්මක භාවනාවේ පියවර **දෙක** නම් කරන්න.

(02) i. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් පහදා දීමට යොදාගත් උපමා **දෙකක්** නම් කරන්න.
ii. කන්ද උඩ දේශනාවෙහි සඳහන් ඉගැන්වීම් **තුනක්** නම් කරන්න.
iii. ශ්‍රී ලංකාවේ සාරධර්ම **පහක්** නම් කරන්න.ඒ ඇසුරින් දේවරාජ්‍යයේ වටිනාකම් ගොඩනගා ගත හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(03) i. ප්‍රධාන දිවැසිවරුන් **දෙදෙනෙක්** නම් කරන්න.
ii. දේශක දිැසිවරුන්ගේ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.
iii. වර්තමාන සමාජයේ දේව වචනයේ පණිවිඩ කරුවෙකු ලෙස දේව වචනය අන් අය වෙතට ගෙන යාමට ඔබ කරන යෝජනා **පහක්** ඉදිරිපත් කරන්න.

(04) i. මල් උයනේ යාච්ඤාව සඳහා ජේසුස් වහන්සේ කැටුව ගිය අපෝස්තුලුවරු **දෙදෙනෙක්** නම් කරන්න.
ii. මල් උයනේ යාච්ඤා වෙන් පෙන්නුම් කරන කරුණු **තුනක්** ලියන්න.
iii. යාච්ඤාව කිතුනු ජීවිතයට අනිවාර්ය අංගයක් විය යුතුය. ඔබේ ජීවිතය තුළත් යාච්ඤාව අත්දකින ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

(05) i. සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන **දෙක** ලියන්න.
ii. පශ්චාත්තාපික ක්‍රියා **තුනක්** ලියන්න.
iii. රෝගී බව නිසා හෝ වයස්ගත වීම නිසා ඇතිවන දුබලතාවය හේතුකොටගෙන ශාරීරිකව හා මානසිකව පීඩාවට පත්ව සිටින අයෙකුට සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන දේව වරප්‍රසාද **පහක්** ලියන්න.

(06) i. ගිහි ධර්මදූත සේවා සමිති **දෙකක්** ලියන්න.
ii. පොදු පූජකවරය ලැබූ විශ්වාසිකයින්ට පැවරෙන **ත්‍රිවිධ** කාර්යය නම් කරන්න.
iii. ප්‍රසාද ස්නාපනයේ දී කිතුණුවා ලද පොදු පූජකවර කැඳවීම තුළ වර්තමාන සමාජ අභියෝග හමුවේ කටයුතු කළ යුතු ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න.

(07) පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන **කෙටි සටහන්** ලියන්න.

i. භාග්‍යවත් තෙරේසා මව්තුමියගේ දයා සේවාව
ii. කිතුණුවකු වශයෙන් පරිසරය සුරැකීමට මගේ දායකත්වය.
iii. අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය.
iv. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය.